PRESS RELEASE
මාධ්‍ය නිවේදනය
பத்திரிகை அறிக்கை

J.R Jayewardane Center, No. 191, Dharmapala mawatha,
Colombo 07
+94 112196618
welfarebenefitboard2016@gmail.com

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD

ජනමාධ්‍ය නිවේදන අංක **WBB/21 - 2026**

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම සහ තහවුරු කිරීම

අභියාචනා සහ විරෝධතා කැඳවීමේ කාල සීමාව **2016.11.15** දිනෙන් අවසන් වූ අතර **2026.11.17** දින සිට බැංකු ගිණුම් විවෘත කිරීම සහ තොරතුරු තහවුරු කිරීම සඳහා ප්‍රතිලාභීන්ට අවස්ථාව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ලබා දී ඇත.

ඒ අනුව, තොරතුරු යථාවත් කිරීමෙන් පසු ප්‍රසිද්ධ කරන ලද නව සුදුසුකම්ලාභීන්ගේ නාම ලේඛනයේ නම් සඳහන් ප්‍රතිලාභීන් බැංකු ගිණුම් ආරම්භ කිරීම සහ තහවුරු කිරීම සඳහා පහත පියවරයන් අනුගමනය කළ යුතුය. එනම්,

- නව අස්වැසුම ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහාම වෙන්වූ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගිණුමක් විවෘත කළ යුතුය.
- ගිණුම් ආරම්භ කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත් කිරීම ආරම්භ කිරීම **2026.11.17** දින සිට තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයෙන් සිදු කරනු ලැබේ.
- බැංකු ගිණුම රාජ්‍ය බැංකුවක ගිණුමක් විය යුතුය.
- බැංකු ගිණුම විවෘත කිරීමෙන් පසු ප්‍රතිලාභීන් නැවත තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සමාජ ආරක්ෂණ තොරතුරු ලේඛනයේ ගිණුම් තොරතුරු යථාවත් කිරීම අනිවාර්ය වේ.
- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගන්නා සියලු ප්‍රතිලාභීන් තමාට අයත් වෙනත් බැංකු ගිණුම් තොරතුරු පරීක්ෂා කිරීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කිරීම දිවුරුම් ප්‍රකාශයක් මගින් කළ යුතුය.සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය ඕනෑම අවස්ථාවක ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් තොරතුරු අදාළ බැංකු සමඟ සම්බන්ධීකරණයෙන් පරීක්ෂා කර බැලීමට මෙම දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රතිලාභියා සිය කැමැත්ත පල කළ යුතු වේ. අදාළ දිවුරුම් ප්‍රකාශයේ ආකෘතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකයෙන් ලබා ගත හැක.
- දැනටමත් සක්‍රිය අස්වැසුම බැංකු ගිණුමක් තිබෙන ප්‍රතිලාභීන් නව ගිණුම් විවෘත කිරීම කළ යුතු නොවේ.
- නව ප්‍රතිලාභීන්ට සහ දෙවන අදියරේ ප්‍රතිලාභීන්ට නොවැම්බර් මස අස්වැසුම ප්‍රතිලාභ දිමනාව **2026.11.27** දින ලබා දීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අපේක්ෂා කෙරේ.

නිමල් කොටවලගේදර
සභාපති / කොමසාරිස්